**නැගෙනහිර පළාත් සභාව - 2020**

------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**-------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**--------------**-----------------------

නැගෙනහිර පළාත් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උප වගන්තියේ විධිවාධාන ප්‍රකාරව සම්පිණ්ඩන වාර්තාව 2021 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 දෙසැම්බර් 14 දින නිකුත් කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සහ ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, නැගෙනහිර පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට නැගෙනහිර පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

## (අ) ප්‍රමාණාත්මක ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය තුළ රුපියල් මිලියන 27.47 ක් වටිනා ජෛව වෛද්‍ය උපකරණ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙත ලැබී නොතිබුණද එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ජෛව වෛද්‍ය උපකරණවල වටිනාකම එම වටිනාකමින්ම අධිගණනය වී තිබුණි. | අංක 215(3)(ඇ) දරන මුදල් රෙගුලාසි අනුව 2021 වර්ෂය තුළදී පොදු තැන්පතු ගිණුමෙන් ගෙවීම් සිදු කර ඇත. | මිලදී ගැනීමකින් තොරව උපකරණවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල නොදැක්විය යුතුය. |
| (ii) | ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් කාර්යාලයේ පළමු මහලේ පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීමේ ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 2.17 ක පුනරාවර්තන ප්‍රතිපාදන යොදා ගෙන තිබීම හේතුවෙන් පුනරාවර්තන වියදම් එම ප්‍රමාණයෙන්ම අධිගණනය වී තිබුණි. | ප්‍රධාන අමාත්‍යාංශයේ පුනරාවර්තන වියදම් සඳහා මෙම අරමුදල වෙන් කර තිබුණි. | පුනරාවර්තන ප්‍රතිපාදන පුනරාවර්තන වියදම් සඳහා යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (iii) | එක්සත් ජාතීන්ගේ ළමා හදිසි අරමුදල (UNICEF) විසින් පහසුකම් සපයන ලද රුපියල් මිලියන 1.29 ක ප්‍රාග්ධන ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය තුළ අපේක්ෂිත කාර්යයන් ක්‍රියාත්මක කිරීමට යොදා නොගෙන නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ පොදු තැන්පතු ගිණුමට මාරු කර ප්‍රාග්ධන වියදම් ලෙස පෙන්වා තිබුණි. මේ අනුව, ප්‍රාග්ධන වියදම් එම ප්‍රමාණයෙන්ම අධිගණනය වී තිබුණි. | එම මුදල පොදු තැන්පතු ගිණුමට මාරු කර 2021 වර්ෂයේදී ගෙවා ඇත. | ප්‍රාග්ධන වියදම්, දැරීමෙන් පසු මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

**(ආ) ගිණුමේ නිරවද්‍යතාවය සහ පැවැත්ම තහවුරු කිරීම සඳහා කිසිදු සාක්ෂියක් නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති එකතුව රුපියල් මිලියන 9,479.43 ක් වටිනා ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම්, ගොඩනැගිලි සහ ව්‍යුහයන් ආදියට අදාල හිමිකම් ඔප්පු, සමීක්ෂණ සැලැස්ම, තක්සේරු වාර්තා නොමැති වීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස පිළිගත නොහැකි විය. | එම සාක්ෂි ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | අදාළ සාක්ෂි ලබාගැනීමට කටයුතු කළ යුතුයි. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව, සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ වංචා හා වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- චේතනාන්විතව මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම,

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශීර්ෂය - 902 - පළාත්සභා ලේකම් කාර්යාලය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වාර්ෂික වාර්තා සහාගත කිරීම** | | |
| | 2014 සිට 2019 දක්වා වූ වර්ෂ සඳහා වාර්ෂික වාර්තා 2021 අගෝස්තු 30 දින වන විටත් නැගෙනහිර පළාත් සභාවේ සභාගත කර නොතිබුණි. | 2017 සැප්තැම්බර් 30 වැනි දින පළාත් සභාව විසුරුවා හරින ලදී. එම නිසා පළාත් සභාව පිහිටවූ පසු එම වාර්ෂික වාර්තා සභාගත කරනු ලැබේ. | වාර්ෂික වාර්තා සභාගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | **නොවිසඳූ විගණන ඡේද** | | |
| | ප්‍රමාණවත් ඇප ලබා ගැනීමකින් තොරව නැගෙනහිර පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ට රුපියල් මිලියන 4.6ක ණය ලබා දී තිබූ අතර 2019 වර්ෂය සඳහා වූ සම්පිණ්ඩන විගණන වාර්තාවේ 6.4(අ) ඡේදයේ විගණකාධිපතිවරයා විසින් වාර්තා කර ඇති පරිදි වර්ෂ 10කට වැඩි රු. මිලියන 1.10ක් හිඟ ලෙස දක්වා තිබුණි. | මෙම හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා මෙම පළාත් සභාවේ නීති අංශය නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් සිටී. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |

**1.5.2 ශීර්ෂය - 910 - ප්‍රධාන අමාත්‍යාංශ කාර්යාලය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **නොවිසඳුනු විගණන ඡේද**<br>හිටපු මහ ඇමැතිවරයාගේ ලේකම්වරයාට අත්තිකාරම් වශයෙන් ගෙවූ රු. මිලියන 2 න් රු. මිලියන 1.12ක මුදලක් අයකරගෙන නොතිබුණි. | නැඟෙනහිර පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව 2016 දෙසැම්බර් 29 වැනි දින හිඟ අත්තිකාරම් ආපසු අයකර ගන්නා ලෙසට නියෝග කරන ලදී. එබැවින් එම කාරණය ප්‍රධාන නීති නිලධාරි වෙත ඉදිරිපත් කර ඇති අතර එම ක්‍රියාවලිය සිදු වෙමින් පවතී. | හිඟ අත්තිකාරම් ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.3 ශීර්ෂය - 911 පළාත් පාලන දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **අධිකාරී බලය නොලත් ගනුදෙනු**<br>2016 ඔක්තොම්බර් 01 සිට 2020 මාර්තු 31 දක්වා කාලය සඳහා ගෝමරන්කඩවෙල ප්‍රාදේශීය සභාව විසින් පත් කරන ලද සහ සේවයේ යොදවා සිටි අනියම් කම්කරුවන් 02 දෙනෙකුට නැගෙනහිර පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් රුපියල් මිලියන 1.43 ක් වැටුප් සහ වේතන ලෙස ප්‍රතිපූරණය කර තිබුණි. | එය වැරදීමකින් වැටුප් සමඟ ප්‍රතිපූරණය කර ඇත. එම මුදල මෙම ප්‍රාදේශීය සභාවෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | මෙම ප්‍රතිපූරණය කළ වැටුප් හා වේතන ප්‍රමාණය අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |

**1.5.4 ශීර්ෂය - 912 - ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **වාණිජ අත්තිකාරම් ගිණුම්**<br>වාණිජ අත්තිකාරම් ක්‍රියාකාරකම්වලට අදාල රුපියල් මිලියන 04 ක් වූ වෙළඳ ණය ගැතියන්ගේ හිඟ ශේෂ වසර 05 ක් පුරා අයකර නොගෙන හිඟ මුදල් ලෙස පැවතුණි. | හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | හිඟ ශේෂයන් ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.5.5 ශීර්ෂය - 921 නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය- මූල්‍ය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **ආදායම් කළමනාකරණය** | | |
| | පුනරාවර්තන ආදායම් ශීර්ෂ 14ක් යටතේ මුළු ආදායම රු.මිලියන **902** ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණද**,** සමාලෝචිත වර්ෂය තුළ සභාව රු.මිලියන **331** ක් පමණක් එකතු කර නොතිබුණි. | මධ්‍යම රජයෙන් බලාපොරොත්තු වූ ආදායම නොලැබුණි. | ඇස්තමේන්තුගත ආදායම වාර්ෂිකව එකතු කර ගැනීම සඳහා ආදායම් ඉන්වොයිසි නියමිත වේලාවට නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | **ආදායම් බෙදාහැරීම (මුද්දර ගාස්තු)** | | |
| | එකතුව රු.මිලියන 349 ක මුද්දර ගාස්තු එකතු කිරීම් වසර 02ට වඩා වැඩි කාලයක සිට පළාත් පාලන ආයතන වෙත ප්‍රේෂණය කිරීමකින් තොරව පැවතුණි. | මුද්දර ගාස්තු පළාත් සභා අරමුදල් ගිණුමට මාරු කරනු ලැබේ. | මුද්දර ගාස්තු නියමිත වේලාවට ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | **අනෙකුත් අත්තිකාරම් ගිණුම්** | | |
| | නැගෙනහිර පළාත් සභාවේ දෙපාර්තමේන්තු 07කට අදාළව රුපියල් මිලියන 32.6ක රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් ශේෂ 2004 ඔක්තෝබර් 11 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 118 වගන්තිය ප්‍රකාරව කටයුතු නොකර වසර 05ක් පුරා පියවා නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | **නොවිසඳුනු විගණන ඡේද** | | |
| (i) | මුද්දර ගාස්තු වශයෙන් අඩු මුදලක් ගෙවීම සඳහා ඉඩම් හිමියන් තම ඉඩම් සඳහා අඩු වටිනාකමක් දක්වා තිබූ අතර අඩුතක්සේරු කරන ලද දේපල සඳහා අවස්ථා 188 කදී රුපියල් මිලියන 5.25 ක දඩ මුදලක් සමඟ අතිරේක මුද්දර ගාස්තු පනවා තිබුණි. කෙසේ වෙතත්, 2019 වර්ෂය සඳහා වූ සම්පිණ්ඩන විගණන වාර්තාවේ 2.2(ඇ) ඡේදයේ විගණකාධිපතිවරයා විසින් වාර්තා කර ඇති | රු. මිලියන 5.25 හි ඉතිරි මුදල් අයකර ගැනීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. | හිග මුද්දර ගාස්තු දඩ සමග අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පරිදි හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ii) | විගණකාධිපතිවරයාගේ 2019 වර්ෂයේ සම්පිණ්ඩන විගණන වාර්තාවේ 2.3(ආ) ප්‍රකාරව ඉඩම් අඩුවෙන් තක්සේරු කිරීම හේතුවෙන් අතිරේක මුද්දර ගාස්තු වටිනාකම ඇගයීම සහ පැනවීම සඳහා 2012 සිට 2018 දක්වා කාලය තුළ නැගෙනහිර පළාතේ ලියාපදිංචි කර ඇති ඔප්පු හයදහස් විසිහයක් (6,026) පළාත් සභාවේ ආදායම් අංශය විසින් තක්සේරු කර නොතිබුණි. | තක්සේරු කිරීම් වේගවත් කරනු ඇත. | ලියාපදිංචි ඉඩමේ සාධාරණ වටිනාකම තක්සේරු කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ඉ)** | **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ සමග අනුකූල නොවීම** | | |
| | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව නිසි ගිණුමට හෝ ආදායමට බැර නොකර හෝ හැකි ඉක්මනින් මුදල් ආපසු ගෙවීමකින් තොරව රැඳවුම් මුදල්, විශේෂ තැන්පතු ආදී පොදු තැන්පතු රුපියල් මිලියන 9.7ක් මාස 09 සිට වසර 02 දක්වා කාලයක් පොදු තැන්පතු ගිණුම්වල රඳවා ගෙන තිබුණි. | අංක 571 දරන මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාමාර්ග ගනු ලැබේ. | තැන්පතු පියවීමට කටයුතු කළ යුතුයි. |

**(ඊ) මූල්‍ය සමාලෝචනය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | **මූල්‍ය ප්‍රතිඵලය/ කාර්යසාධනය** | | |
| | ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ පළාත් සභාවේ මෙහෙයුම් කටයුතු වලින් ලද අතිරික්තය රු. මිලියන 1,724 ක් වූ අතර ඉකුත් වර්ෂය සමග සැසඳීමේ දී ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 1,153 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 571 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි. මෙම වර්ධනය සඳහා සමාලෝචිත වර්ෂයට අදාලව රු. මිලියන 5,347 ක් වූ සාමූහික ප්‍රදාන (Block Grant) වැඩිවීම හේතු වී තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | ආදායම් වැඩි කිරීමට අදාල විවිධ පළාත් ආදායම් මාර්ග හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

**(ii) ආදායම් හා වියදම් විචලනයන්**

| වර්ෂය | 2020 | 2019 | විචලනය |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ආදායම | 31,225 | 27,529 | 3,696 |
| වියදම | 29,501 | 26,376 | 3,125 |
| අතිරික්තය | 1,724 | 1,153 | 571 |

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පෙර වර්ෂය සමග සැසඳීමේදී සාමුහික ප්‍රදාන රු.මිලියන 5,347 කින් හෙවත් සියයට 25 කින් වැඩි වී ඇති අතර වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ පෙර වසර හා සසඳන විට රු. මිලියන 2,476 කින් හෙවත් සියයට 12 කින් වැඩි වී තිබුණි. මේ අනුව, පෙර වර්ෂය හා සැසඳීමේදී අතිරික්තය රු.මිලියන 571 කින් හෙවත් සියයට 49 කින් වැඩි වී තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | පළාත් ආදායම වැඩිකර, අනුමත සේවක සංඛ්‍යාවට ගෙවීමට කටයුතු කළ යුතුයි. |

## 1.5.6 ශීර්ෂය - 922 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය - සැලසුම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) පළාත් සංවර්ධන සැලසුම්** | | |
| සමාලෝචිත වර්ෂයේ පළාත් සංවර්ධන සැලැස්ම යටතේ රුපියල් මිලියන 2,924.24 ක් වටිනා යෝජනා 790 ක් අනුමත වුවද, රුපියල් මිලියන 900 ක ඇස්තමේන්තුගත නව වැඩ සහ කෙරීගෙන යන වැඩ යෝජනා 93 ක් සමාලෝචිත වර්ෂය තුළ අග්‍රිම නොමැතිකම සහ Covid-19 වසංගත තත්ත්වයන් හේතුවෙන් අවසන් කර නොතිබිණි. | මූල්‍ය ප්‍රතිපාදන නොමැතිකම සහ Covid-19 තත්ත්වය හේතුවෙන් සම්පත් එක්රැස් කිරීමට අපහසු පරිසරයක් නිර්මාණය විය. | සංශෝධිත ක්‍රියාකාරකම් සැලැස්මට අනුව නතරකරන ලද කාර්යය ක්‍රියාත්මක කිරීමට සහ යෝජිත වැඩ සම්පූර්ණ කිරීමට ප්‍රමුඛව ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | **ප්‍රමාදවූ ව්‍යාපෘති**<br>---------------------<br>නැගෙනහිර පළාත් සැලසුම් ලේකම් කාර්යාලය විසින් කොන්ත්‍රාත් කරුවෙකුට රුපියල් මිලියන 194.5 ක එකඟ වූ කොන්ත්‍රාත්තු මිලකට ලබා දී ඇති සිව්මහල් කාර්යාල ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු 2018 සැප්තැම්බර් 04 හෝ ඊට පෙර නිම කළ යුතු අතර ඒ සඳහා 2021 ජුනි 29 දක්වා රුපියල් මිලියන 152.91 ක් ගෙවා තිබියදී පසුගිය වසර 03 තුළ 07 වරක් වැඩ දීර්ඝ කර තිබුණි. කෙසේ වෙතත් 2021 නොවැම්බර් 15 දින දක්වා ඉදිකිරීම් වැඩ නිම කර නොතිබුණි. | නොවැළැක්විය හැකි හේතු මෙම කාර්යය නිම කිරීම ප්‍රමාද වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. | මනා ඉදිකිරීම් අධීක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුයි. |
| (ඇ) | **තිරසර සංවර්ධන අරමුණු**<br>------------------------------<br>නැගෙනහිර පළාතේ තිරසාර සමතුලිත සංවර්ධනයක් සඳහා කේන්ද්‍රස්ථානයක් පිළිබඳ දැක්ම ඇතිව නැගෙනහිර පළාත් සභාවේ සැලසුම් ලේකම් කාර්යාලය පිහිටුවනු ලැබුවද, **2017** අංක **19** දරන තිරසාර සංවර්ධන පනතට අනුව නැගෙනහිර පළාත් සභාවේ ලේකම් කාර්යාල, අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු ඇතුළු ආයතන හතළිහක් විසින් වසර **03**කට වැඩි කාලයක් තුළ තිරසාර සංවර්ධන ඉලක්ක, සාක්ෂාත් කර ගත් ඉලක්කය, ඉලක්ක ලගා කර ගැනීමේ ප්‍රගතිය වරින් වර සමාලෝචනය කර නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. | සියලුම පළාත් නියෝජිතායතන ඔවුන්ගේ අංශ ඉලක්ක මත පදනම්ව **2020** වසර සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව දැනටමත් ඉදිරිපත් කර ඇත. | තිරසාර සංවර්ධන ඉලක්ක හඳුන්වා දීමට කටයුතු කළ යුතුයි. |

## 1.5.7 ශීර්ෂය - 923 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය - පරිපාලන

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **කාර්ය මණ්ඩල පරිපාලනය පිළිබඳ නිරීක්ෂණ** | | |
| ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන් 09 දෙනෙකු වසර 06 සිට 13 දක්වා එක් සේවා ස්ථානයක සේවය කර තිබුණි. කෙසේ වෙතත්, පළාත් සභාවේ සේවය කළ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තිය වසර 05කින් ක්‍රියාත්මක කර නොතිබුණි. | ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවන් ඔවුන්ගේ විශේෂිත අත්දැකීම් මත අධ්‍යාපන දෙපාර්තමේන්තුවට සහ පළාත් පාලන දෙපාර්තමේන්තුවට මාරු කර ඇත. | වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය සකස් කිරීමට කටයුතු කළ යුතුයි. |

## 1.5.8 ශීර්ෂය - 924 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය - ඉංජිනේරු

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **මතභේදයට තුඩුදෙන කරුණු** | | |
| | ගිවිසුම්ගත සේවාවන සනීපාරක්ෂක සේවා සහ ආරක්ෂක සේවාවල සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා කොන්ත්‍රාත්කරු විසින් දායක විය යුතු වුවද, දායක මුදල් සඳහා සේවායෝජකයාගේ ලියාපදිංචිය පිළිබඳ විස්තර ඇගයීමකින් තොරව 2020 මැයි 01 සිට 2020 දෙසැම්බර් 31 දක්වා කාලය සඳහා රුපියල් මිලියන 9.04 ක් නැගෙනහිර පළාත් සභාව විසින් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි | මේ වන විට ETF සහ EPF දායකත්වයට අදාළ අවශ්‍ය ලියකියවිලි පරීක්ෂා කර අදාළ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මඟින් ගෙවීම් සිදු කෙරේ. | EPF/ETF දායකත්වය සඳහා ලියාපදිංචි වීමේ විස්තර තහවුරු කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | **නඩත්තු හා අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට අපොහොසත් වීම** | | |
| | නැගෙනහිර පළාත් සභාවට අයත් අබලන් වාහන 340ක් නිසි නඩත්තුවක් හෝ අලුත් වැඩියාවක් නොකර වසර 01කට වඩා වැඩි කාලයක් විවිධ දෙපාර්තමේන්තුවලට අයත් විවිධ වාහන අංගනවල තබා ඇත. | දෙපාර්තමේන්තු ප්‍රධානීන්, යාන්ත්‍රික ඉංජිනේරුවන්ගේ නිර්දේශය මත තම වාහනය අලුත්වැඩියා කිරීමට පියවර ගත යුතුය. | වාහන අලුත්වැඩියා කර ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

**(ඇ) නිශ්ක්‍රීය/ ඌණ උපයෝජිත වත්කම්**

| | | |
|---|---|---|
| නැඟෙනහිර පළාතේ තාක්ෂණික අධ්‍යාපන කටයුතු සඳහා පාසල් 32කින් භාවිතයට ගත නොහැකි සහ පරණ වාහන 25ක් ඉල්ලා තිබුණද, එම වාහන විවිධ වාහන ගාල්වල රඳවා තබා ඇත. | වාහන ලබාගන්නා ලෙස සියලුම අධ්‍යාපන කලාපවලට දුරකථනයෙන් දැනුම් දී තිබුණි. | තාක්ෂණික අධ්‍යාපනයේ අපේක්ෂිත අරමුණු සඳහා මෙම වාහන භාර දීමට කටයුතු කළ යුතුය. |

## 1.5.9 ශීර්ෂය - 926 - පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්** | | |
| ඒ ඒ ආයතනවල අනුමත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, අයවැය ඇස්තමේන්තුව, ප්‍රසම්පාදන සැලැස්ම, අයවැය යෝජනා සහ අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කළ යුතු වේ. තවද, ආයතනවල ඵලදායී කාර්ය සාධනය සහතික කිරීම සඳහා, කාර්ය සාධන විගණනය, පද්ධති විගණනය, මූල්‍ය විගණනය සහ ආයතනවල අධි අවදානම් ක්‍රියාකාරකම් පිළිබඳ විගණනය කෙරෙහි අවධානය යොමු කරන විශේෂ විමර්ශන ආදි සියල්ල ආවරණය කළ යුතුය. කෙසේ වෙතත්, 2019 ජනවාරි 12 දින කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/ 01- 2019 ප්‍රකාරව වසර 02ක් පුරා කාර්ය සාධන විගණනය සිදු කර නොතිබුණි. | අනාගතයේදී අවධානය යොමු කිරීමට උපදෙස් ලබා දී ඇත. | පළාත් සභාවේ කටයුතු පිළිබඳ කාර්ය සාධන විගණනය සිදුකිරීමට කටයුතු කළ යුතුය. |

## 1.5.10 ශීර්ෂය - 932 - සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **අත්හැර දැමූ ව්‍යාපෘති** | | |
| 2019 වසරේ වෙන් කරන ලද පළාත් විශේෂිත සංවර්ධන ප්‍රතිපාදන අරමුදලින් ව්‍යාපෘති තුනක් සඳහා රුපියල් මිලියන 5.4ක පිරිවැයක් ඇස්තමේන්තු කර තිබුණද, එම ව්‍යාපෘති වසර 02ක් පුරා ආරම්භ නොකර අත්හැර දමා තිබුණි. | අග්‍රිම නොමැතිවීම් හේතුවෙන් ව්‍යාපෘති සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | අනුමත ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘති ආරම්භ කර නියමිත වේලාවට අවසන් කළ යුතුවේ. |

## 1.5.11 ශීර්ෂය - 934 - වාරිමාර්ග දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු** | | |
| පොතුවිල්හි නැගෙනහිර පළාත් වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය සඳහා ඇස්තමේන්තුව රුපියල් මිලියන 21.8 ක්වූ තෙමහල් ගොඩනැඟිල්ලක් ඉදිකිරීමේ කටයුතු 2010 වර්ෂයේදී ආරම්භ කර ඒ සඳහා රුපියල් මිලියන 4 ක් වැය කර තිබූ නමුත් ඉතිරි වැඩ වසර 10 ක් ගත වුවද අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021 වසර සඳහා CBG ප්‍රතිපාදන යටතේ මෙම ගොඩනැගිල්ලේ බිම් මහල පමණක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 9.40 ක ගොඩනැගිලි සැලසුම් ඇස්තමේන්තු යෝජනාවක් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් වෙත යවා තිබුණද, මේ දක්වා කිසිදු ප්‍රතිචාරයක් ලැබී නොමැත. | ඉතිරි වැඩ ආරම්භ කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

## 1.5.12 ශීර්ෂය - 941 - අධ්‍යාපන දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **ගුරුවරුන්ගේ අතිරික්තය හා හිඟය සහ අනුයුක්ත කිරීම් සම්බන්ධයෙන් අධ්‍යාපන අංශයට අදාළ නිරීක්ෂණ** | | |
| (i) | ශ්‍රී ලංකා විදුහල්පති සේවයෙන් විදුහල්පතිවරුන් බඳවා ගැනීමට කටයුතු නොකර වසර 5කට වඩා වැඩි කාලයක සිට පාසල් 250කට වැඩ ආවරණයට විදුහල්පතිවරුන් 250ක් පත් කර තිබුණි. | විදුහල්පතිවරුන් බඳවා ගැනීමෙන් පසු ඉක්මනින්ම මෙම තාවකාලික වැඩපිළිවෙල අවලංගු කෙරේ. | ප්‍රමාදයකින් තොරව විදුහල්පතිවරුන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ii) | අධ්‍යාපන කලාප 14ක පාසල්වල විදුහල්පතිවරුන් 293කගේ තනතුරු සියයට 04 සිට සියයට 63 දක්වා ප්‍රතිශතයකින් පුරප්පාඩු වී තිබූ අතර අම්පාර දිස්ත්‍රික්කයේ අනෙකුත් අධ්‍යාපන කලාප 03 ක පාසල්වල විදුහල්පතිවරුන් 33ක අතිරික්තයක් තිබුණි. | විදුහල්පතිවරු හිඟ පාසල් සඳහා අතිරික්ත සේවක සංඛ්‍යාව මාරු කිරීමට කටයුතු කරනු ලැබේ. | විදුහල්පතිවරුන් හිඟ පාසල් සඳහා විදුහල්පතිවරුන් අනුයුක්ත කිරීමට කටයුතු කළ යුතුයි. |
| (iii) | අධ්‍යාපන කලාප 11 ක පාසල්වල සියයට 05 සිට සියයට 23 දක්වා ප්‍රතිශතයක් ලෙස ගුරුවරුන් 1,262කගේ තනතුරු පුරප්පාඩු වී තිබූ අතර අනෙකුත් අධ්‍යාපන කලාප 06 ක පාසල්වල ගුරුවරුන් 1,063ක් අතිරික්තයක් පැවතුණි. | ගුරු හිඟ පාසල් සඳහා අතිරික්ත සේවක සංඛ්‍යාව මාරු කිරීමට කටයුතු කරනු ලැබේ. | ගුරුවරු හිඟ පාසල් සඳහා ගුරුවරුන් අනුයුක්ත කිරීමට කටයුතු කළ යුතුයි. |

## 1.5.13 ශීර්ෂය - 950 - සෞඛ්‍ය අමාත්‍යාංශය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ සමග අනුකූල නොවීම** | | |
| 2016 අගෝස්තු 26 දිනැති අංක 04/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් සංශෝධිත ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5:4:1 උපවගන්තිය ප්‍රකාරව, නැගෙනහිර පළාත් සෞඛ්‍ය සේවා අමාත්‍යාංශයේ නිලධාරීන් 08 දෙනෙකුගෙන් වසර 01කට වඩා වැඩි කාලයක සිට රුපියල් මිලියන 1.47ක නිල නිවාස කුලිය අයකරගෙන නොතිබුණි. | සියලුම නිල නිවාස සඳහා කුලී ඇස්තමේන්තු දැනට තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. | ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන අනුව නිල නිවාස කුලිය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.5.14 ශීර්ෂය - 951 - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

---

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **මෙහෙයුම් අකාර්යක්ෂමතා** | | |
| | ඩිජිටල් සෞඛ්‍ය ව්‍යාපෘතිය යටතේ ඉලෙක්ට්‍රොනික වෛද්‍ය වාර්තා ක්‍රමය හඳුන්වා දෙමින් රජයේ සෞඛ්‍ය සේවාවල ගුණාත්මක භාවය සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ලැප්ටොප් පරිගණක සහ වෙනත් උපකරණ අනුවක් ලබා දී තිබුණද, එම උපකරණ ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් භාවිතා නොකර දෙහිඅත්තකණ්ඩිය, කාත්තන්කුඩි, වාලච්චේන, එරාවුරන්ද් යන ප්‍රදේශවල පිහිටි මූලික රෝහල් හතරක වසර 01 සිට 03 දක්වා කාලයක් රඳවා ගෙන තිබුණි. | වෙන් කර ඇති මුදල් ප්‍රයෝජනයට ගනිමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. | වත්කම් ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **බදු අවශ්‍යතාවයට අනුකූල නොවීම** | | |
| (i) | රුපියල් මිලියන 5.55 ක්වූ එකතු කළ අගය මත බද්ද (VAT) සියයට 08 බැගින් ගෙවිය යුතු වුවද, නැගෙනහිර පළාතේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල තුනකින් රුපියල් මිලියන 10.42 ක් සියයට 15 බැගින් ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 (අ) වගන්තියට සහ 2019 නොවැම්බර් 29 දිනැති අංක 2151/52 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2005 අංක 06 දරන පනතට පටහැනිව, 2019 දෙසැම්බර් 01 සිට 2020 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ රුපියල් මිලියන 4.87 ක මුදලක් කොන්ත්‍රාත්කරුවන්ට වැඩිපුර ගෙවා තිබුණි. | අග්‍රිම නොමැතිකම හේතුවෙන් ඉහත ගෙවීම් නියමිත කාලය තුළ සිදු නොකළ අතර පසුව සියයට **5** ක අනුපාතයකින් ගෙවා ඇත. | මෙම වැඩිපුර ගෙවූ එකතු කළ අගය මත බද්ද (VAT) අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 2016 වසරේ සිට 2020 දක්වා කාලය තුළ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල 03ක් මඟින් එකතුව රුපියල් මිලියන 2.94ක්වූ ජාතිය ගොඩනැගීමේ බද්ද 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත ප්‍රකාරව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකර සැපයුම්කරුවන් වෙත ගෙවා තිබුණි. | ගෙවූ සම්පූර්ණ මුදල සැපයුම්කරුවන්ගෙන් අයකර ගන්නා ලෙස අදාළ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්ට උපදෙස් දී තිබේ. | බදු මුදල් අයකරගෙන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුයි. |

## 1.5.15 ශීර්ෂය - 961 - මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වාණිජ අත්තිකාරම් ගිණුම්** | | |
| (i) | වාණිජ අත්තිකාරම් ක්‍රියාකාරකම්වල රුපියල් මිලියන 1.4ක යන්ත්‍රෝපකරණ කුලියට දීමේ ගාස්තු වසර 10 කට වඩා වැඩි කාලයක සිට අයකරගෙන නොතිබුණි. | මෙම හිඟ ශේෂයන් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග අරඹා ඇත. | එකතු කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | යන්ත්‍රෝපකරණ ඒකකයේ වාණිජ කටයුතු සඳහා ලාභය ඉලක්ක කරගත් යාන්ත්‍රණයක් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් රුපියල් මිලියන 3 සිට රුපියල් මිලියන 5 දක්වා පාඩු වසර 03කට වඩා වැඩි කාලයක සිට පැවතුණි. | ලාභය අරමුණු කරගත් විධිමත් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | යන්ත්‍රෝපකරණ ඒකකයේ ක්‍රියාකාරකම් පිළිබඳ ඵලදායී සමාලෝචනයක් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **නඩත්තු හා අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට අපොහොසත් වීම** | | |
| | යන්ත්‍රෝපකරණ ඒකකයේ වාණිජ අත්තිකාරම් කටයුතු සඳහා මිලදී ගත් යන්ත්‍ර සූත්‍ර 30ක් වසර 02 සිට 10 දක්වා කාලය තුළ අලුත්වැඩියා කිරීමට කටයුතු නොකර නිෂ්ක්‍රීයව තිබුණි. | යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීමට කටයුතු කර ඇත. | යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කර ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඇ)** | **නිෂ්ක්‍රීය/ ඌණ උපයෝජිත වත්කම්** | | |
| | ජයිකා (JICA) ව්‍යාපෘතිය මගින් 2013 වර්ෂයේදී පරිත්‍යාග කරන ලද පාංශු පරීක්ෂණ උපකරණ 8ක් නැගෙනහිර පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අම්පාර රසායනාගාරයට සහ නැගෙනහිර පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ මඩකලපුවේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයට නිකුත් කර තිබුණද අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා නොකර වසර 07ක් පුරා අක්‍රියව පවතී. | ඉදිරියේදී මෙම පරීක්ෂණ උපකරණ කාර්යක්ෂමව භාවිත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | පරිත්‍යාග කරන ලද ද්‍රව්‍ය පාංශු පරීක්ෂණ කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.5.16 ශීර්ෂය - 962 - ඉඩම් පරිපාලන දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **නොවිසඳුනු විගණන ඡේද**<br>2019 වර්ෂය සඳහා වූ සම්පිණ්ඩන විගණන වාර්තාවේ 2.4(ආ) ඡේදයේ විගණකාධිපති විසින් දක්වා ඇති පරිදි නැඟෙනහිර පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 09 ක් මගින් බදු දී ඇති රජයේ ඉඩම්වලට අදාළ එකතුව රු. මිලියන **328.89** ක බදු කුලිය නැගෙනහිර පළාත් සභාවේ ඉඩම් පරිපාලන දෙපාර්තමේන්තුව විසින් අයකර නොගෙන වසර **01** සිට වසර **04** දක්වා කාලසීමාවක් හිඟ මුදල් ලෙස තිබුණි. | රුපියල් මිලියන 328.89ක්වූ මෙම බදු කුලී අයකර ගැනීමට කටයුතු කරමින් සිටී. | බදු කුලී හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |

## 1.5.17 ප්‍රඥප්ති ගිණුම්

### (අ) නිවාස අධිකාරිය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **කාර්ය මණ්ඩල පරිපාලනය පිළිබඳ නිරීක්ෂණ**<br>නැගෙනහිර පළාත් සභාව විසින් සම්මත කරන ලද ව්‍යවස්ථා ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළ ස්ථාපිත ව්‍යවස්ථාපිත ආයතන දෙකක් සඳහා නැගෙනහිර පළාත් සභාවේ නිවාස අධිකාරිය විසින් කාර්ය මණ්ඩලය **21** දෙනෙකු සඳහා පෞද්ගලික පඩිනඩි වෙනුවෙන් එකතුව රුපියල් මිලියන **7**ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ | අනුමැතිය සඳහා වන ඉල්ලීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට කිහිප වතාවක්ම යොමු කර තිබුණද, ප්‍රතික්ෂේප කර තිබුණි. | සේවක සංඛ්‍යාව සහ බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය අනුමත කිරීමට ක්‍රියා කළ යුතුය. |

වෙතත්, බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය හෝ කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව වසර 04 සිට 07 දක්වා කාල පරාසයකදී අනුමත කර නොතිබුණි.

**(ආ) මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **ආදායම් කළමනාකරණය**<br>සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ පුනරාවර්තන ආදායම් ලෙස දක්වනු වෙනුවට මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ ප්‍රාග්ධන ලැබීමක් ලෙස රුපියල් මිලියන **29.75** ක් වූ මාර්ග බලපත්‍ර ආදායම දක්වා තිබුණි. | එය සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ප්‍රකාශයේ පුනරාවර්තන ආදායම ලෙස සඳහන් කර ඇත. | මාර්ග බලපත්‍ර ආදායම පුනරාවර්තන ආදායමක් ලෙස පෙන්වීමට කටයුතු කළ යුතුයි. |

**(ඇ) සංචාරක කාර්යාංශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **කාර්ය මණ්ඩල පරිපාලනය පිළිබඳ නිරීක්ෂණ**<br>නැගෙනහිර පළාත් සභාව විසින් සම්මත කරන ලද ප්‍රඥප්ති ප්‍රකාරව ස්ථාපිත නැගෙනහිර පළාත් සභාවේ සංචාරක කාර්යාංශයේ ව්‍යවස්ථාපිත ආයතන **02**ක් විසින් සමාලෝචිත වර්ෂය තුළදී කාර්ය මණ්ඩලය **13** දෙනෙකු සඳහා පුද්ගල වැටුප් සඳහා රුපියල් මිලියන **4**ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, වසර **04** සිට **07** දක්වා කාලයක සිට බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය හෝ කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව අනුමත කර නොතිබුණි. | මෙම අනුමැතිය සඳහා වන ඉල්ලීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත කිහිප වතාවක්ම යොමු කර තිබුණද එය දිගින් දිගටම ප්‍රතික්ෂේප වී තිබුණි. | සේවක සංඛ්‍යාව සහ බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය අනුමත කිරීමට ක්‍රියා කළ යුතුය. |